# ඩාෆා අධ්‍යාත්මික පුහුණුව බරපතල කාරණයකි

"ඔබට මුලින් තිබූ අධිෂ්ඨානයෙන් පුහුණු වන්න, එවිට සාර්ථකත්වය සහතිකයි." මේවා අධ්‍යාත්මික ප්‍රජාවේ සත්‍ය වචන යි. ඩාෆා, උතුම් මාර්ගය, සාමාන්‍ය ජනතාවට ඉගැන්වීමත් සමඟ, ඉතා වැදගත්කමක් ඇති උසස් රහස් රාශියක් හෙළිදරව් වුනා. ඒවායේ හෙළිදරව් වීම සාමාන්‍ය ජනතාවට පමණක් නොව, අධ්‍යාත්මික පුහුණුවීම්වල ජීවිත ගත කරන අයට, සහ දිව්‍යමය රාජධානීන්හි සිටින අයට පවා, පෙර නොවූ විරූ ලෙස, සිත් ඇදගත්තා. ජනයා කෙනෙකු පසුපස තවකෙකු, කලින් නියමකල සම්බන්ධතාවයක් ඇති හා නොමැති දෙපිරිසම, ඩාෆා හි ඉගැන්වීම් ලබා ගැනීමට පැමිණියා සහ අධ්‍යාත්මික පුහුණුව ලබා ගත්තා. කෙසේ වෙතත්, ඇතැමෙක් දැඩි කැපවීමක් සහිත හැඟීමකින් පටන් ගත්තද, ඔවුන්ගේ පුහුණුව තුල කාලයත් සමඟ ගොඩනඟා ගත් බොහෝ බැඳීම් අත්හැරීමට දුෂ්කර බව සොයාගත් සමහරුන් ඉන්නවා. කාලයාගේ ඇවෑමෙන් ඔවුන්ගෙන් සමහරුන් පුහුණුවෙන් ලිහිල් වුනා. රැකියාවේහි කාලය අවශ්‍යතා සහ පවුලේ කටයුතු හොඳින් හසුරුවා නොගැනීමත් මෙයට එකතු වුනා, සහ මෙම පුද්ගලයින්ට ෆා අධ්‍යයනයට සහ ව්‍යායාම සඳහා ඔවුන්ට කාලය ඊටත් වඩා අඩු බව දැනුනා. ඔවුන් ඉඳහිට පුහුණුවන්නන්ගේ කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට සහභාගී වුවද, ඔවුන්ට කඩිසර බවට පත්වීම සලස්වා ගැනීමට නොහැකියි. කාලයත් සමග ඔවුන් කිසිසේත්ම අධ්‍යාත්මික පුහුණුවීමක පුහුණුවන්නෙකු මෙන් නොවූවා, සහ කිසිදු පුහුණුවන්නෙකු නොකළ යුතු දේ පවා කිරීමට පටන් ගත්තා. ඔවුන් දිගටම මෙලෙස කළ හොත් අනතුර තමන් වෙත තිබෙනවා!

ෆා-නිවැරදි කිරීමේ ඩාෆා ශිෂ්‍යයින්ගේ තත්ත්වයට එක් එක් පුද්ගලයා එක් වූ විට, ඔවුන්ගේ දැනුවත් පැත්ත දිව්‍යමයන් සමග, පොරොන්දුවක් දුන්නා, සහ ප්‍රතිඥාවක් අත්සන් කළා, සහ ඩාෆා ශිෂ්‍යයෙකු ලෙස ඉටු කළ යුතු ඓතිහාසික මෙහෙවර ඉටු කරන බවට ඔවුන් තමන්ගේ මුල් ආත්මයෙන්ම දිවුරුම් දුන්නා, එබැවින් ඔවුන් එතැන් පටන් තුන් ලොවෙහි ආධිපත්‍යයට පරිභාහිරව සිටියා. සහ එබැවින් මම, ඔබගේ ගුරුතුමා, සියලුම ඩාෆා ශිෂ්‍යයින්ගේ නම් තුන් රාජ්‍යයේ, මනුෂ්‍ය රාජ්‍යයේ, අධෝලෝකයේ, සහ නිරයේ පවා ලෙජර වලින් ඉවත් කළා. එතැන් පටන් ඩාෆා ශිෂ්‍යයින්ගේ ජීවිත තිබුනේ ඩාෆාහි හස්තයෙහි පමණි, සහ පුනරුත්පත්තියෙන් නිදහස් කරනු ලැබූවා; පාපයන් ඇති අය පවා තව දුරටත් අපායට බැඳෙන්නේ නැහැ. ඔවුන්ගේ පුහුණුව හොඳින් කරන අයවලුන් වෙනුවෙන් අධ්‍යාත්මික පරිපූර්ණත්වය සූදානම්ව සිටිනවා. ඔවුන් තමන්ගේම දිව්‍යමය රාජධානියක් පාලනය කරනු ලබන, නව විශ්වයෙහි ඔවුන්ගේ ස්ථානයට ඔවුන් නැවත යනු ඇත. ඔවුන්ගේ ස්වකීය-ගුණවගාව තුළ සාර්ථක නොවන අය, ඔවුන්ගේ පොරොන්දුව කඩ කරන අය, හෝ උතුම් මාර්ගයට විරුද්ධව පව් කරන අය ඔවුන්ගේ ආත්මයෙන් වූ පොරොන්දුවට අනුරූපීව ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වේවි! නමුත් මා කරුණාවන්තව ඔවුන්ට තවත් අවස්ථා ලබා දෙමින් සිටිනවා. ඔවුන් ඒ සඳහා කෘතඥ විය යුතු බව පවා ඔවුන් අවබෝධකර ගන්නේ නැහැ, එහෙත්, සහ ඔවුන්ගේ බැඳීම් වෙත මුරණ්ඩු ලෙස අල්ලාගෙන සිටිනවා.

ඩාෆා ශිෂ්‍යයින් නියැළෙන අධ්‍යාත්මික පුහුණුවීම ස්වරූපයෙන් ඉතා ලිහිල් වුවත්, අධ්‍යාත්මික සංවර්ධනයට කැපවී සිටින පුද්ගලයන් වශයෙන්, ඔවුන් සඳහා වන සම්මතය, දැඩියි, හා ගාම්භීරයි, සහ ඔවුන්ගේ ඓතිහාසික මෙහෙවර බරපතලයි සහ ඉතා සැලකිය යුතුයි. අධ්‍යාත්මික පරිපූර්ණත්වය අත්කර ගන්නා ඩාෆා ශිෂ්‍යයින් විශේෂ ජීවීන් බවට පත්වනවා, සහ විශ්වය පුරා සිටින දිව්‍යමය අයගේ ඇස් හමුවේ ඔවුන් ෆා-නිවැරදි කිරීමේ කාල වකවානුව තුළ පණ පොවන ලද සුවිශේෂ ශුද්ධ ජීවීන් වෙනවා. ඩාෆා ශිෂ්‍යයන් කෙරෙහි පැරණි බලවේග මෙතරම් දරුණු වී තිබෙන්නේ ඇයි? එක් අතකින්, ඔවුන් ඔබ ගැන ඊර්ෂ්‍යා කරනවා. අනෙක් අතට, ඔවුහු ඕනෑවට වඩා වැඩියෙන් සහ ඉතා දැඩි පෘතග්ජන සිතුවිලි ඇති, විවිධ අවස්ථාවන් තුළ ෆා මත පුහුණු නොකරන ලද, සහ දේවල් දෙස පෘතග්ජන ආකාරයෙන් බලන ඇතැම් ඩාෆා ශිෂ්‍යයන් පහත් කොට සලකනවා. හොඳින් ඉන්නේ නැති අයට පීඩාවන් වැඩි වන්නේ ඒ නිසායි, සහ දිගටම එය එසේම වෙනවා නම් එය අවංකව භයානකයි!

ෆා-නිවැරදි කිරීම දැන් එහි අවසානයට ළඟා වෙමින් තිබෙනවා, සහ ඔවුන්ගේ පුහුණුව තුළ සැබැවින්ම ඔවුන් වෙනුවෙන් වැඩ කිරීම සලස්වා ගෙන නොතිබෙන හෝ දිගු කලක් තමන්ගේ පොරොන්දුවට ගරු කිරීමට සහ ඔවුන්ගේ ඓතිහාසික මෙහෙවර ඉටු කිරීමට අපොහොසත් වූ

පුද්ගලයන් ගණනාවක් ඉවත් කිරීමට පැරණි බලවේගයන්ට අවශ්‍ය වී තිබෙනවා. සහ මෙලෙස ඔවුනට පුහුණුවන්නන් සමඟ මිශ්‍ර වූ නරකම පුද්ගලයින්ගේ ශරීරවලට වැහෙන බිහිසුනු භාවයන් තිබෙනවා, සහ දීර්ඝ කාලයක් ෆා වෙතින් ඉවත් වී සිටින සහ සැබැවින්ම ඔවුන් වෙනුවෙන් වැඩ නොකරන පුහුණුවන්නන් කුපිත කිරීමට ඔවුන්ගේ පෘථග්ජන සිතිවිලි, බැඳීම්, අමනාපයන්, සහ අනෙකුත් දුෂ්ට සිතිවිලි වෙත අල්ලා ගන්නවා. එය ධාෆා ශිෂ්‍යය සමූහය පටලැවීමට උත්සාහ කරන සිදුවීමක් ලෙස සම්බන්ධ වුවද, ඇත්ත වශයෙන්ම පැරණි බලවේග ධාෆා ශිෂ්‍යයිනගේ සමස්ත සමූහය පිරිසිදු කිරීමට, ඔවුන් පුහුණු වන විට ඔවුන්ගේ බැඳීම් වලින් ඔවුන්වම නිදහස් කරගැනීමට නොහැකි අය, දීර්ඝ කලක් ෆා මත පදනම් වීමට නොහැකි වූ අය, සහ ඔවුන්ට පුහුණුවීම හසුරුවා ගැනීමට නොහැකි ලක්ෂ්‍යයට වෙනස් වූ අය, සහ හාත්පස පටලවමින් පමණක් සිටින අය ධාෆා ශිෂ්‍යයින් තුළින්ම නිරාවරණය කිරීමට මෙම පුද්ගලයින් යොදා ගන්නවා. මෙම තීරණාත්මක අවස්ථාවේදී, එම පුද්ගලයන් සමඟ එකඟ වන කවුරුන් හෝ, ඔහුව පවිත්‍ර කිරීමේ අරමුණින්, පහසුවෙන් හඳුනාගනු ලබන කෙනෙකු වෙනවා. පැරණි බලවේග, තිරයෙන් පිටුපස සිට, මේ දිනවල ගැටළු අවුස්සන එම පුද්ගලයන්, ප්‍රයෝජනයට ගැනීමේ සැබෑ හේතුව මෙයයි.

ඔවුන් එය නොදැන සිටියත් සහ ඇත්ත වශයෙන්ම ඒ අදහස ප්‍රතික්ෂේප කළත්, කරදර අවුස්සන අයව බිහිසුනු භාවයන් විසින් පාලනය කරනු ලබනවා. එහි ගැටළුව නම්, සැබවින්ම බැඳීම් සහ දුක්ගැනවිලි ඇති සමහර පුද්ගලයන්ට ඔවුන්ට ප්‍රේක්ෂක පිරිසක් ලබා දීම, ඔවුන් සමඟ එකඟ වීම, පිළිගැනීම හා ඔවුන්ට සවන් දීම, සහ ඔවුන්ගේ දේවල් නැරඹීම හෝ කියවීම, ධාෆා සහ අධ්‍යාත්මික පුහුණුවේ ඇති බරපතලකම සහ ගාම්භීර බව සම්පූර්ණයෙන්ම නොසලකා හැරීමයි. නමුත් ධාෆා යනු දිව්‍යලෝකයේ මාර්ගයයි, සහ කිසිවෙකුට අවුල් කළ හැකි දෙයක් නොවේ! අවුල් කළ හැකි වන්නේ මිනිසුන්ගේ මනසයි. එලෙස රඟපාන්නේ හරියටම පැරණි බලවේග වලට නැතිකර දැමීමට අවශ්‍යය අයයි. දිගු කලක් ෆා වෙතින් ඉවත් වූ පුද්ගලයින් විශේෂ අවධානයක් යොමු කළ යුතුය. [ගැටලු අවුස්සන පුද්ගලයන්] සමග එකඟ වීමට වඩාත් හුරු බවක් ඇති අය වන්නේ බැඳීම්, අමනාපයන් ඇති අය, හෝ ඔවුන් කළ වැරදි නිසා මිනිසුන් බේරා ගැනීම සඳහා වූ ධාෆා ව්‍යාපෘතියකින් නෙරපා හරින ලද අය හෝ බලවත් අසන්තෝෂයෙන් සිටින අයයි. සහ මොවුන් එක්ව කතා කරන විට සහ ඔවුන්ගේ දුක් ගැනවිලි ප්‍රකාශ කරන විට, එය ඔවුන්ගේ පෘතග්ජන සිතීම් වල අති විශාල විදහා පෙන්වීමකි. මා සඳහන් කරන ආකාරයේ පුද්ගලයන් අපගේ ඉගැන්වීම්, ෆා, මත පදනම්ව දේවල් කිසිවිටක ඇගයීමට ලක් නොකරන බව, සහ එසේ අමනාපව සිටීම මා සඳහා එය සුදුසුද? එය ස්වකීය-ගුණවගාව කිරීමට කැප වූ පුද්ගලයෙකුට ගැළපෙනව ද? එය අපගේ ඉගැන්වීම්වලට අනුකූලද? ඔවුන්ගෙන්ම නොඅසන බව අපට පෙනෙනවා. පුද්ගලයෙකු ඔහුගේ ආධ්‍යාත්මික පුහුණුවේ දී දුර්වල ලෙස කටයුතු කරන විට, එය පුද්ගලික කාරණයකි. නමුත් ඔහුගේ ක්‍රියාවන් අපගේ පුහුණුවට දරුණු හානියක් කරන විට සහ මිනිසුන් බේරා ගැනීමට අප දරන උත්සාහයට බලපාන විට එය බරපතල දෙයකි. එය සියලු ජීවිත බේරා ගැනීමේ අරමුණ උදෙසා නිර්මාතෘවරයා සහ දිව්‍යමයන් විශාල ගණනක් වසර මිලියන ගණනක් පුරා, සිදු කළ ක්‍රියාවක් වන විට, මෙම ඇදහිය නොහැකි තරම් වැදගත් ෆා-නිවැරදි කිරීම කඩාකප්පල් කිරීමට මිනිසුන්ට ඉඩ දිය හැක්කේ කෙසේද?! එවැනි බාධා කිරීම් කිසිඳු රාජ්‍යයක සිටින කිසිඳු ජීවියෙකු කිසිසේත්ම කිරීමට එඩිතර නොවිය යුතු අද්විතීය පාපයකි!

බොහෝ කලක සිට ඔවුන් පුහුණුවීම් නතර කර ඇති බවත්, සහ ඔවුන් තවදුරටත් අපගෙන් කෙනෙකු නොවන බැවින් ඔවුන් ධාෆා හට හානිකර දේවල් පැවසීම හෝ කිරීම ඔවුන්ට ගැටළුවක් නැතැයි සිතන සමහරුන්ද සිටිනවා. මම ඔවුන්ට මෙය කියනවා: ඔබ එකල පුහුණුවීම්වලට සම්බන්ධ වීමට ඔබට හැකි වුනේ ඔබ ඔබේ ජීවිතයෙන් ප්‍රතිඥාවක් දී තිබූ නිසායි. ඔබ කොපමණ වයසක සිටිනවාද හෝ කොපමණ කලකට පෙර එය සිදු කලාද යන්න වැදගත් නැහැ; පොරොන්දු ගාම්භීර දෙයකි. මෙයින් අදහස් කරන්නේ, ඔවුන් තවදුරටත් පුහුණුවීම් නොකරන බව පවසන අයට, ඔබ බොහෝ කලකට පෙර හෝ මෑතකදී ධාෆා හැර ගියත් කමක් නැහැ: ඔබ තවදුරටත් පුහුණුවීම් නොකළත් ඔබේ පොරොන්දුව ඉටු කළ යුතුය බවයි. ෆා-නිවැරදි කිරීමේ කාලය තුළ විශ්වයේ උතුම් මාර්ගයේ ශිෂ්‍යයෙකු වීමට ඔබට මුලින් අවශ්‍යය වීම ඇදහිය නොහැකි තරම් ගාම්භීර දෙයකි. එය ඕනෑම ජීවියෙකු සඳහා අතිවිශාල වැදගත්කමක් ඇති තේරීමක් වන අතර, පොරොන්දුව අත්සන් කර ඇත්තේ ඔබගේ සම්පූර්ණ ජීවිතයත් සමගින්ය! ඔබට අවශ්‍ය නම් පුහුණු වීමට, සහ ඔබට අවශ්‍ය නොවේ නම් නැවැත්වීමට තීරණය කිරීම තරම් එය සරල බව ඔබ සිතනවාද? විශ්වීය පරිමාණයේ මෙන්ම දිව්‍යමය අයගේ සහ නිර්මාතෘවරයාගේ වගකීමෙන් මිදීමට මිනිස් ජීවියෙකුට ඉඩ දිය හැකිද?! ඔබ එය අත්සන් කළ පසු ඔබේ පොරොන්දුව ඉටු කළ යුතුමය!

මම අනුකම්පාවෙන් නැවත වතාවක්—සහ අවසාන වතාවට—මෙම ඉගැන්වීම මේ පුද්ගල කණ්ඩායමට ලබා දෙනවා. ඔබටම යහපතක් කර ගන්න සහ ඔබේ ශ්‍රේෂ්ඨම ප්‍රයෝජනය වෙනුවෙන් ඉදිරි මාවත තෝරාගෙන! දුෂ්ට චීන කොමියුනිස්ට් පක්ෂය විසින් පාලනය කරනු ලබන දැවැන්ත ජාතියක සම්පූර්ණ බලය එකට එකතු කොට අපව මර්ධනය කිරීමට පැරණි බලවේග විසින් යොදවා ඇති විට ඔබගේ ආධ්‍යාත්මික පුහුණුවේ බරපතලකම පැහැදිලි විය යුතු නොවේද? අතීතයේ කිසි දිනෙක මනුෂ්‍යයන් දිව්‍යමයන් වී නැහැ. එසේනම් මෙය බරපතල කාරණයක් නොවන්නේ කෙසේද? ඔවුන්ගේ පුහුණුව හොඳින් සිදු නොකළ ඩාෆා ශිෂ්‍යයිනගේ වේදනාකාරී පාඩම් ඔබව අවදි කිරීමට ප්‍රමාණවත් නොවේද?

ලී හොන්ග්ෂී ගුරුතුමා

2023, සැප්තැම්බර් 1